


# 15

# පාපයන්ගෙන් වැළකී සිටිමු



"කවරෙකු (පාපයන්ගෙන් වැළකී) තමන් පවිත්‍ර කර ගත්තේ ද සැබැවින් ම ඔහු ජයග්‍රහණය කළේ ය." (අල් කුර්ආනය 87:14)

"නියත වශයෙන් ම අල්ලාහ් පින් සහ පව් සටහන් කරන්නේ ය" යැයි පැවසූ නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණෝ පහත පරිදි විස්තර කළහ. කෙනෙකු යහපතක් කිරීමට සිතූ විට අල්ලාහ් ඒ වෙනුවෙන් පිනක් සටහන් කරයි. ඔහු එය ඉටු කළ විට එයට දහයේ සිට හත්සිය ගුණයක් නැතහොත් ඊටත් වඩා වැඩියෙන් සටහන් කරයි. කෙනෙකු පාපයක් කිරීමට සිතා එය ඉටු නොකළේ නම් ඒ වෙනුවෙන් පිනක් සටහන් කරයි. එය ඔහු ඉටු කළේ නම් එයට එක් පවක් සටහන් කරයි.

(බුහාරි, මුස්ලිම්)

මිනිසුන්ගේ ක්‍රියා කොටස් දෙකකට බෙදේ. එකක් පින්වත් ක්‍රියා වන අතර අනෙක පාපතර ක්‍රියා වේ. ජනයා පින්වත් දේ ප්‍රිය කරති. තනි පුද්ගලයකුට හෝ සමාජයට හෝ අහිතක් කරන ක්‍රියා පාපයන් වේ; පාප ක්‍රියා මගින් මානව සම්මත උල්ලංඝනය වේ. සමාජයේ අයිතිවාසිකම් කඩ කෙරේ; ජනයාගේ සාමාන්‍ය ජීවිතයට බලපෑම් ඇති වේ. ලෝකයේ නොසන්සුන්තාව වර්ධනය වේ.

පුණ්‍ය කටයුතු අධික ලෙස කරන ලෙසත් පාප ක්‍රියාවන්ගෙන් මුළුමනින් ම ඉවත් වන ලෙසත් ඉස්ලාමය අපට අණ කරයි. පුණ්‍ය ක්‍රියා අපගේ මනසට තෘප්තිය හා සතුට ලබා දී ස්වර්ගය වෙත රැගෙන යයි. පාප ක්‍රියා "වරදකරු" යන හැඟීම අප තුළ ඇති කොට සිත අඳුරු කරයි. එසේ ම නිරයට ඇද දමයි. පාපයේ කුලිය දඬුවමයි. පාපයේ යෙදෙන්නන්ට දඬුවම් කරන බවට අල් කුර්ආනය අනතුරු අඟවන්නේ ය.

**නුඹලාගේ මෙදින හමුවීම නුඹලා අමතක කළ හේතුවෙන් නුඹලා (දැන් දඬුවම) රස විඳිවු. (අද දින) සැබැවින් ම අපි ද නුඹලා (මුදවා ගැනීමට) අමතක කර දැමුවෙමු. තව ද නුඹලා කරමින් සිටි දෑ හේතුවෙන් සදාතනික දඬුවම රස විඳිවු. (යැයි ඔවුනට පවසනු ලැබේ.) (අල් කුර්ආන් 32:14)**

පාප ක්‍රියා කොටස් දෙකකට බෙදේ. එකක් සුළු පාප කර්ම වන අතර අනෙක මහා පාප කර්ම වේ. සුළු පාප කර්මය අප මහා පාප කර්මය කරා ගෙන යයි. මහා පාප මගින් විනාශය ඇති වේ. අඛණ්ඩ ලෙස පාප කර්මවල නියැලී සිටීමෙන් විනාශ වූ සමාජ පිළිබඳ අල් කුර්ආනයේ සඳහන් වේ. ආද්, සමූද් වර්ගයා, ෆිර්අවුන් හා ඔහුගේ පිරිවර, නුම්රූද් යනාදීහු එසේ විනාශයට ලක්වූවන්ට උදාහරණයෝ වෙති.

මෙලොව උපත ලද සියලු මිනිසුන් මරණයට පත් වෙති. සියල්ලන් ම පරලෝ දිනයට මුහුණ දිය යුතු ම ය. එම දිනයේ සියලු දෙනා තම තමන්ගේ ක්‍රියාවන්ට සාධාරණ හේතු ඉදිරිපත් කළ යුතු ය. කිසිවකුටත් තමන් කළ පාප වසන් කළ නොහැක. මන්දයත් ඒ පිළිබඳව විමසීමේ දී ශරීර අවයව, පාපය කළ ස්ථානය, මලාඉකාවරුන්ගේ සටහන් යනාදී සාක්ෂි පදනම් කොට ඒවා තහවුරු කරනු ලබන්නේ ය.

**එදින අපි ඔවුන්ගේ මුඛයට කතා කිරීමට නොහැකි වන අයුරින් මුද්‍රා තබන්නෙමු. තව ද ඔවුන්ගේ අත් අප වෙත කතා කරයි. ඔවුන් කරමින් සිටි පාප පිළිබඳ ඔවුන්ගේ පාද ද සාක්ෂි දරයි. (අල් කුර්ආන් 36:65)**

කෙනෙකුට තම ක්‍රියා අන් අයට නොපෙන්වා සැඟවිය හැකි ය. නමුත් එය තමා සමගම පවතින ශරීර අවයවයන්ට සැඟවිය හැකි ද? මිනිසාගේ ක්‍රියා සියල්ල කෙරෙන්නේ අවයව මගිනි. මෙම තත්ත්වයට අනුව පරලොව දී එම අවයව ම සාක්කි ලෙස ඉදිරිපත් කරනා විට එය ප්‍රතික්ෂේප කරන්නේ කෙසේ ද?

**තව ද කවරෙකු අණු ප්‍රමාණයක තරම් අයහපතක් සිදු කරන්නේ ද ඔහු එය (ද) දැක ගනී. (අල් කුර්ආන් 99:8)**

මිනිස්සු පාප කිරීමේ ස්වභාවයෙන් යුක්ත වූවෝ වෙති. ෂෙයිතාන් මිනිසාගේ සතුරා ය. ඔහු පාප කෙරෙහි මිනිසුන් පොළඹවමින් සිටී. ඔහුට අවනත වන්නන් පරලොව දී අත්හැර දමනු ලැබේ. ඔහුගේ කුමන්ත්‍රණයෙන් මිදීමට දේව සිතුවිලි කෙරෙහිත්, ඉබාදත් කෙරෙහිත් අවධානය යොමු කළ යුතු ය. එසේ ම යහපත් පරිසරයක ද, යහගැත්තන්ගේ

ඇසුර සමඟ ද ජීවත්වීමට උත්සාහ කළ යුතු ය.

**තව ද යහපත කෙරෙහි ද බිය භක්තිය කෙරෙහි ද නුඹලා එකිනෙකා උදවු කර ගනිවු. තව ද පාපය කෙරෙහි ද ක්‍රෝධය කෙරෙහි ද නුඹලා එකිනෙකා උදවු කර නොගනිවු** (5:2) යනුවෙන් අල් කුර්ආනය අපට උපදෙස් දෙන්නේ ය.

**"නබිවරයාණෙනි, පවසන්න නියත වශයෙන්ම මගේ නාථයා (නුසුදුසු යැයි) තහනම් කර ඇත්තේ, රහසිගතව හා ප්‍රසිද්ධියේ කරනු ලබන අශික්ෂිත ක්‍රියා, අනෙකුත් පාප, අසාධාරණ ලෙස (කෙනෙකු තවත් කෙනෙකුට) වද වේදනා දීම, කිසිදු මූලාශ්‍රයක් නොමැතිව අල්ලාහ්ට ඔබ ආදේශ කිරීම, ඔබ නොදන්නා දේ අල්ලාහ් වෙත, (අසත්‍ය ලෙස) පැවසීමත් වේ."** (7:33)

**අල්ලාහ් සහ ඔහුගේ දූතයාණන් වැළැක්වූ මහා පාප සමහරක් පහත දැක්වේ.**

- අල්ලාහ්ට කෙනෙකු හෝ යමක් සම කිරීම
- හූනියම් කිරීම
- ඝාතනය කිරීම
- පොලිය භුක්ති විඳීම
- අනාථයන්ගේ දේපොළ භුක්ති විඳීම
- සටනක දී පසුබැස පලායාම
- පතිවත රකින කාන්තාවකට අවලාද කීම

(බුහාරි, මුස්ලිම්)

තවත් සමහර පාප කර්ම පිළිබඳව අල් කුර්ආනය හා හදීසය මෙසේ විස්තර කොට ඇත.

**"විශ්වාස කළවුනි, සැබැවින් ම සුරාව ද සූදුව ද (බිලිපූජා කරන) පිළිම ද (පංගු තීන්දු කිරීම සඳහා භාවිත කරන) ඊතල ද ෂෙයිතාන්ගේ ක්‍රියාවෙන් වූ අපිරිසිදු (දෑ) ම ය." (අල් කුර්ආන් 5:90)**

"දෙමාපියන්ට පීඩා කරන්නා ද, කේලම් කියන්නා ද, මත්පැනට ඇබ්බැහිව සිටින්නා ද, ස්වර්ගයට නොපිවිසේ." (බුහාරි, මුස්ලිම්)

"සියදිවි හානි කරගන්නා ඒ මගින් ම පරලොව දී වේදනාවට ලක් කරනු ලබන්නේ ය." (තිර්මිදි)

තවත් බොහෝ පාප ක්‍රියා ඇත. ඒවායින් අප වැළකී ජීවත් විය යුතු ය. පාපය සිදු වූයේ මිනිසුන් වෙත නම් අදාළ පුද්ගලයන්ගෙන් සමාව ලබාගැනීම අනිවාර්ය වේ. පසුව අල්ලාහ්ගෙන් සමාව අයැදිය යුතු ය. ඒවා අල්ලාහ් හා සම්බන්ධ පාප නම් ඍජුව ඔහුගෙන් සමාව අයැදිය යුතු ය. ජයග්‍රහණයේ මාවත වන්නේ මෙයයි.

"තමන් කළ අපරාධයෙන් පසුව කවරෙකු පශ්චාත්තාප කර (තම ක්‍රියාවන්) සංශෝධනය කර ගත්තේ ද එවිට සැබැවින් ම අල්ලාහ් ඔහු කෙරෙහි පශ්චාත්තාපය පිළිගන්නේ ය." (අල් කුර්ආන් 5:39)

ඉස්ලාමීය මගපෙන්වීම අනුගමනය කොට පාපයන්ගෙන් වැළකී, වැඩි වැඩියෙන් පින් දහම් රැස් කර පරලොව දී යහපත් ආනිශංස ලබා ගැනීමට උත්සාහ කරමු.

පාඩමේ ඇතුළත් වැදගත් අරාබි වචන

حَتّٰى مَطْلَعِ الْفَجْرِ

**අභ්‍යාස**

1. පාප ක්‍රියා මගින් ඇති වන බලපෑම් 3ක් සඳහන් කරන්න.
2. ආද්, සමූද් වර්ගයා විනාශ කිරීමට හේතුව කුමක් ද?
3. පරලොව විමසුමේ දී ගෙනෙනු ලබන සාක්ෂි මොනවා ද?
4. මුස්ලිම්වරුන් කුමන කරුණෙහි දී එකිනෙකා අන්‍යෝන්‍ය වශයෙන් උදවු උපකාර කළ යුතු යැයි අල් කුර්ආනය පවසන්නේ ද?
5. සොරකම් කළ වරදට අදාළ දඬුවම කුමක් ද?
6. පාඩමේ සඳහන් වූ මහා පාප කර්ම හත ලියන්න.
7. නොදැනුවත්ව පාප කර්මවල නියැලුණු පුද්ගලයන් කළ යුතු පිළියම කුමක් ද?
8. පාප ක්‍රියා ව්‍යාප්තවීම වැළැක්වීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ලැයිස්තුගත කරන්න.